# අයවැය පොරොන්දු: මැති සබයෙන් ඔබ්බට

2018 වසර මැද තක්සේරුව

ඔක්තෝබර් 2021

© Verité Research

## පටුන


අයවැය පොරොන්දු: මැති සබයෙන් ඔබ්බට ........ 3

ඇගයීම් ක්‍රමවේදය ........ 3

1. වියදම් යෝජනා ........ 4

    1.1. විවෘතභාවය ඇගයීම ........ 4

    1.2. රජයේ ආයතනවල විවෘතභාවය ශ්‍රේණිගත කිරීම ........ 5

    **තොරතුරු ලබා ගැනීමේ පහසුව:** ........ 5

    1.3. ප්‍රගතිය මැනීම ........ 6

2. ප්‍රතිපත්ති යෝජනා ........ 8

    2.1. ප්‍රගතිය මැනීම ........ 8

3. ප්‍රගතිය, විවෘතභාවය සහ ශ්‍රේණිගත කිරීමේ තක්සේරු පිළිබඳ විස්තර. ........ 9

# අයවැය පොරොන්දු: මැති සබයෙන් ඔබ්බට

2017 වසරේ අරඹන ලද "අයවැය පොරොන්දු: මැති සබයෙන් ඔබ්බට" වාර්ෂිකව අයවැය කතාවෙහි සඳහන් පොරොන්දු ඉටුකිරීමෙහිලා රජයේ කාර්ය සාධනය වාර්තා කරන publicfinance.lk යටතේ ඇති ඩැෂ්බෝර්ඩයක් වේ

ආණ්ඩුව ඉදිරිපත් කරන වාර්ෂික අයවැය කතාවෙහි අයවැය පොරොන්දු පිළිබඳ මූලික ප්‍රශ්න දෙකකට පිළිතුරු සෙවීම මෙම ඩැෂ්බෝර්ඩය මූලික අරමුණ වේ.

- (i) රජය ක්‍රියාවට නංවන්නේ පවසන දෙය ද?
- (ii) රජය පවසන්නේ ක්‍රියාවට නංවන දෙය ද?

මෙම ඩැෂ්බෝර්ඩය හරහා ඉහත ප්‍රශ්න වලට පිළිතුරු ජනතාවට ලබා දීමෙහි අරමුණ වන්නේ,

- (i) රජයේ අයවැය පොරොන්දු සම්බන්ධව විවෘතභාවය වර්ධනය කිරීම සහ
- (ii) අයවැය පොරොන්දු ඉටුකිරීම සම්බන්ධව රාජ්‍ය ආයතනවල වගවීම වර්ධනය කිරීමයි

# ඇගයීම් ක්‍රමවේදය

අයවැය කතාවේ සඳහන් රුපියල් මිලියන 500කට වඩා වැඩි නව වැය යෝජනා හෙවත් පොරොන්දු වෙනුවෙන් වෙන්කළ ප්‍රතිපාදනවල ප්‍රගතිය මෙම ඩැෂ්බෝර්ඩය මගින් විමසා බැලේ. මෙම යෝජනා අයවැය ලේඛනයෙහි 2 වන ඇමුණුමෙහි සඳහන් වේ. 2019 දී මෙම වේදිකාව ප්‍රතිපාදන වෙන් කිරීමක් නොමැති, නීති සහ රෙගුලාසි වල වෙනස්කම් වැනි ප්‍රතිපත්ති යෝජනා විමසා බැලීම ආරම්භ කරන ලදී.

| වසර | තෝරාගත් වියදම් යෝජනා | | | තෝරාගත් ප්‍රතිපත්ති යෝජනා |
|---|---|---|---|---|
| | තෝරා ගැනීමේ සීමාව[1] | යෝජනා ගණන | යෝජනා වල මුළු වටිනාකම | යෝජනා ගණන |
| 2017 | රු. බිලියන 1ට වැඩි | 37 | රු. මිලියන 116,910 | 0 |
| 2018 | රු. බිලියන 1ට වැඩි | 38 | රු. මිලියන 149,350 | 0 |
| 2019 | රු. මිලියන 500 ට වැඩි | 37 | රු. මිලියන 100,875 | 22 |

වසරකට දෙවතාවක් යාවත්කාලීන කරන මෙම වේදිකාව නව වියදම් විවෘතභාවය සහ ප්‍රගතිය යන දර්ශක දෙකක් යටතේ ඇගයීමට ලක් කරයි.ප්‍රතිපත්ති යෝජනා ක්‍රියාත්මක කිරීම තනි ප්‍රගති දර්ශකයක් භාවිතයෙන් නිරීක්ෂණය කරනු ලැබේ. ප්‍රතිපත්ති යෝජනා වල තත්වය ප්‍රධාන වශයෙන් ඇගයීමට ලක් කරනු ලැබුවේ ප්‍රසිද්ධියේ ලබා ගත හැකි

[1] 2017 සහ 2018 දී තෝරා ගැනීමේ සීමාව පදනම් වූයේ යෝජනා සඳහා යෝජිත වියදම් වෙන් කිරීම මත පමණි. අයවැය කථාවේ වාර්තාකරණ ආකෘතියේ වෙනසක් හේතුවෙන් 2019 දී තෝරා ගැනීමේ සීමාව පදනම් වූයේ යෝජිත ප්‍රතිපාදන යෝජනාව සහ එයට දැනටමත් වෙන් කර ඇති මුදල එකතු කිරීම මත ය.

තොරතුරු හරහා වන අතර තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් පනත යටතේ ගොනු කරන ලද ඉල්ලීම් මත රැඳී සිටීමෙන් නොවේ. එබැවින් ප්‍රතිපත්ති යෝජනා ඇගයීමට ලක් කිරීමේදී විවෘතභාවය පිළිබඳ දර්ශකයක් නොමැත.

ආණ්ඩුවේ අර්ධ වාර්ෂික කාර්ය සාධනය එම වසරේ ඔක්තොබර් මස තුළදීද, සමස්ථ වාර්ෂික කාර්ය සාධනය ඊළඟ වසරේ අප්‍රේල්/ මැයි මස තුළදීද එළි දක්වයි. [2]

# 1. වියදම් යෝජනා

## 1.1. විවෘතභාවය ඇගයීම

මෙම දර්ශකය, අයවැය යෝජනා සම්බන්ධයෙන්, රජය පවසන්නේ ක්‍රියාවට නංවන දෙයද යන්න අධ්‍යයනය කෙරේ. මෙහි දී අගයීමට ලක් කරන්නේ අයවැය පොරොන්දු වල ප්‍රගතිය පිළිබඳ තොරතුරු කොපමණ දුරට රජය හෙළිදරව් කරන්නෙද යන්නයි. මේ සඳහා අවශ්‍ය අයවැය පොරොන්දුවලට අදාළ තොරතුරු අදාළ රාජ්‍යය ආයතනයේ වෙබ් අඩවි පරීක්ෂා කිරීම සහ තොරතුරු දැනගැනීමේ පණත (RTI) යටතේ රාජ්‍යය ආයතන වෙත තොරතුරු ඉල්ලුම් පත්‍ර ඉදිරිපත් කිරීම මගින් රැස්කර ඇත. 2017 සහ 2018 වර්ෂවලදී රජයේ ආයතන වෙත ගොස් සහ එම ආයතන වෙත අවිධිමත් ඉල්ලීම් කර ද තොරතුරු රැස් කරන ලදී. කෙසේ වෙතත්, එම තොරතුරු රැස් කිරීමේ ක්‍රමය මේ වනවිට අත්හිටුවා ඇත.

අර්ධ වාර්ෂික ඇගයීමේදී, වසරේ පළමු මාස හය තුළ අයවැය පොරොන්දු ප්‍රගතිය සම්බන්ධයෙන් තොරතුරු හෙළි කිරීම අගයන අතර, වසර අවසානයේ ප්‍රගතිය සම්බන්ධයෙන් තොරතුරු හෙළි කිරීම සමස්ත වසර අවසානයේදී ඇගයීමට ලක් කරයි.

ඇගයීම කරන අවස්ථාවේ දී ලබා ගත හැකි තොරතුරු මත පදනම්ව විවෘතභාවය පහත පරිදි වර්ගීකරණය කර ඇත.

**ආවෘත-** සමස්ථ වසර තුල ප්‍රගතිය ඇගයීමට අවශ්‍ය කිසිදු තොරතුරක් නැත

**සීමිත-** තිබෙන තොරතුරු සමස්ථ වසර තුල ප්‍රගතිය ඇගයීමට ප්‍රමාණවත් නැත

**උදාසීන-** ප්‍රගතිය පිළිබඳ තොරතුරු ලබාගැනීමට සහ/හෝ ලබා දුන් තොරතුරු භාවිතා කරමින් ප්‍රගතිය ඇගයීමට දැඩි පරිශ්‍රමයක් දැරීමට සිදුවිය

**සාධනීය-** අයවැය පොරොන්දුවේ ප්‍රගතියට අදාළ තොරතුරු අදාළ කාලය තුළ ඉල්ලුම් කිරීමෙන් ලබාගත හැකිය

**විවෘත-** පොරොන්දුවේ සමස්ථ ප්‍රගතිය පිළිබඳ තොරතුරු ප්‍රගාමීව හෙළිදරව් කර ඇත

---

[2] 2019 අයවැය කථාව ප්‍රමාද වී 2019 මාර්තු මාසයේදී පමණක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ බැවින් 2019 දී වසර අවසානයේ ඇගයීම පමණක් සිදු කරන ලදී.

## 1.2. රජයේ ආයතනවල විවෘතභාවය ශ්‍රේණිගත කිරීම


ඒ ඒ රාජ්‍ය ආයතනය තමන් ක්‍රියාත්මක කිරීමට බැඳී සිටින පොරොන්දු පිළබඳ තොරතුරු හෙළිදරවු කිරීම මත පදනම්ව එම ආයතනවල විවෘතභාවය පිළිබඳ සංසන්දනාත්මක ශ්‍රේණිගත කිරීමක් මෙමඟින් සපයයි. සෑම ආයතනයකටම 0 සිට 100 දක්වා ලකුණු ලැබෙනු ඇති අතර ඉහළම ලකුණු මට්ටම පෙන්නුම් කරන්නේ ලකුණු 100 කින්ය. අනතුරුව, වර්ෂය තුළ ඔවුන්ගේ සාපේක්ෂ ක්‍රියාකාරිත්වය පෙන්නුම් කරමින්, වැඩිම ලකුණු ගත් ආයතනයේ සිට අඩුම ලකුණු ගත ආයතනය දක්වා රාජ්‍ය ආයතන ඉහළ සිට පහළට ශ්‍රේණිගත කරනු ලැබේ.

රාජ්‍ය ආයතනය සඳහා වන සමස්ත ලකුණු ගණනය කරනු ලබන්නේ එම ආයතනයේ විෂය පථයට අයත් එක් එක් පොරොන්දුවේ ලකුණු වල බරිත සාමාන්‍යක් ලෙස ය. සෑම පොරොන්දුවක්ම 0 සිට 100 දක්වා පරාසයක් තුල ඇගයීමට ලක් කෙරේ. සෑම පොරොන්දුවක් සඳහාම ලකුණු ගණනය කරන (i) පොරොන්දුවේ ප්‍රගතිය ඇගයීමේදී ලද තොරතුරු කොපමණ දුරට ප්‍රයෝජනවත්ද සහ (ii) කොතරම් පහසුවෙන් එම තොරතුරු ලබා ගත හැකි වුවාද යන කරුණු දෙක මත ය.

තොරතුරු භාවිතයට සුදුසු වීම/ භාවිතා කිරීමේ හැකියාව: ලබා ගත් තොරතුරු, සම්පූර්ණයෙන් ප්‍රයෝජනයට ගත හැකි, අර්ධ වශයෙන් ප්‍රයෝජනයට ගත හැකි සහ කිසිසේත්ම ප්‍රයජෝනයට ගත නොහැකි යනුවෙන් බාණ්ඩ තුනකට වර්ග කර, පිලිවෙලින් 100, 50 සහ 0 වශයෙන් ලකුණු ලබා දෙන ලදී.

### තොරතුරු ලබා ගැනීමේ පහසුව:

ලබාගත් තොරතුරු වල ප්‍රයෝජනවත්බව අනුව ලබා දුන් ලකුණු, එම තොරතුරු ලබා ගැනීමේ පහසුව අනුව නැවත සකස් කරනු ලැබේ. මෙහිදී තොරතුරු දැනගැනීමේ පනත යටතේ ඉල්ලුම් කිරීමෙන් තොරතුරු ලබා ගැනීමේ හැකියාවට සාපේක්ෂව අන්තර්ජාලය හරහා ඉල්ලුම් කිරීමකින් තොරව තොරතුරු ලබා ගැනීමේ හැකියාවට වැඩි ලකුණු හිමි වෙයි.



## 1.3. ප්‍රගතිය මැනීම

මේ දර්ශකය යටතේ රජය තමන් සිදු කරන බව පැවසූ ක්‍රියාකාරකම් කෙතරම් දුරකට ඉටු කර ඇත්ද යන්න විමසා බැලේ. එනම් මෙහිදී පොරොන්දු ඉටු කිරීමේ ප්‍රගතිය ඇගයීමට ලක්කරයි. මෙම ඇගයීම කරන්නේ පොරොන්දුව ඉටුකිරීමට වගකිව යුතු රාජ්‍ය ආයතනය විසින්ම ප්‍රකාශයට පත් කරන ලද කාලසීමාවන් හා ඉලක්ක පදනම් කරගෙනය.

අයවැය පොරොන්දු වල *අර්ධ වාර්ෂික ප්‍රගතිය* පහත පරිදි වර්ගීකරණය කර ඇත.

**හෙළිකර නැත-** ප්‍රගතිය ඇගයීමට කිසිදු තොරතුරක් නැත. නැතහොත් පවත්නා තොරතුරු ප්‍රගතිය ඇගයීමට ප්‍රමාණවත් නැත

**අතහැර දමා ඇත-** මෙම පොරොන්දුව තක්සේරු කිරීමේ වර්ෂය සඳහා ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර නොමැත

**නොසලකා හැර ඇත-** මෙම පොරොන්දුව ක්‍රියාවට නැංවීමට සැලසුම් කර ඇතත් ක්‍රියාත්මක කිරීම ආරම්භ කර නැත

**මන්දගාමී ප්‍රගතියක් ඇත-** මෙම පොරොන්දුව ක්‍රියාවට නංවා ඇතිමුත් නියමිත කාලයට කටයුතු සිදු කිරීමට අසමත් වී ඇත

**සතුටුදායක ප්‍රගතියක් ඇත-** මෙම පොරොන්දුව ක්‍රියාවට නංවා ඇති අතර අදාළ ඉලක්කය අත්පත් කරගෙන හෝ ඉලක්කය අභිබවා ගොස් ඇත[3]

අයවැය පොරොන්දු වල *වාර්ෂික ප්‍රගතිය* පහත පරිදි වර්ගීකරණය කර ඇත.

**හෙළිකර නැත-** ප්‍රගතිය ඇගයීමට කිසිදු තොරතුරක් නැත. නැතහොත් පවත්නා තොරතුරු ප්‍රගතිය ඇගයීමට ප්‍රමාණවත් නැත/ ප්‍රයෝජනයට ගත නොහැක.

**අතහැර දමා ඇත-** වසරේ ක්‍රියාකාරී සැලසුමෙන් ඉවත්කර හෝ වසර තුල කිසිදු ප්‍රගතියක් වාර්තා කර නොමැත

**දුර්වලයි-** ඉලක්කගත ප්‍රගතියෙන් 33% වඩා අඩු ප්‍රගතියක් අත්පත් කරගෙන ඇත.

---

[3] අයවැය පොරොන්දුවක් සතුටුදායක ප්‍රගතියක් ලබාඇති බවට වර්ගීකරණය කෙරෙනුයේ ජූනි 30වන දින වන විට අයවැය වර්ෂයේ ඉලක්ක වලින් 90% ක් වත් අදාළ කාලය තුළ නිම කර ඇත්නම් පමණි.

**අර්ධසම්පූර්ණයි-** ඉලක්කගත ප්‍රගතියෙන් 33%-66% අතර ප්‍රගතියක් අත්පත් කරගෙන ඇත.

**සැළකිය යුතුයි-** ඉලක්කගත ප්‍රගතියෙන් 66%-80% ත් අතර ප්‍රගතියක් අත්පත් කරගෙන ඇත.

**සම්පූර්ණයි-** ඉලක්කගත ප්‍රගතියෙන් 80% ඉක්මවූ ප්‍රගතියක් අත්පත් කරගෙන ඇත

# 2. ප්‍රතිපත්ති යෝජනා

2019 දී BudgetPromises.Org විසින් අයවැය කථාවේදී රජය විසින් කරන ලද ප්‍රතිපත්තිමය කැපවීම්වල ප්‍රගතිය නිරීක්ෂණය කිරීම සඳහා සිය විෂය පථය පුළුල් කළේය. මෙම යෝජනා සඳහා ප්‍රතිපාදන වෙන් කිරීමක් නොමැත.

ව්‍යවස්ථාදායක/ නීතිකාරක/ නීති සම්පාදක පැනවීමක් හෝ නියාමන දැනුම්දීම් (ගැසට්) "ක්‍රියාත්මක කර ඇත" හෝ "අර්ධ වශයෙන් ක්‍රියාත්මක කර ඇත" ලෙස සැලකීමට අවශ්‍යතාවය මත මෙම යෝජනා තෝරා ගන්නා ලදී. පොදුවේ ලබා ගත හැකි ගැසට් නිවේදන, රජයේ චක්‍රලේඛ, රජයේ තොරතුරු දෙපාර්තමේන්තුවේ කැබිනට් තීරණ පිළිබඳ නිවේදන වලින් තොරතුරු ලබා ගන්නා ලදී. ප්‍රතිපත්තිය පිළිබඳ පොදු තොරතුරු නොමැති විට, ලිපි, දුරකථන ඇමතුම් සහ විද්‍යුත් තැපැල් මගින් තොරතුරු සඳහා අමාත්‍යාංශහට සෘජුවම සම්බන්ධ විය.

## 2.1. ප්‍රගතිය මැනීම

අයවැය කථාවේ හඳුන්වා දී ඇති ප්‍රතිපත්ති යෝජනා ක්‍රියාත්මක කිරීමේදී රජය ලබා ඇති ප්‍රගතිය මෙමගින් විමසා බැලේ.

- **හෙළිකර නැත-** ප්‍රගතිය ඇගයීමට කිසිදු තොරතුරක් නැත. නැතහොත් පවත්නා තොරතුරු ප්‍රගතිය ඇගයීමට ප්‍රමාණවත් නැත.

- **ක්‍රියාත්මක කර නැත-** යෝජනාවේ කිසිදු කොටසක් සඳහා අවශ්‍ය ව්‍යවස්ථාදායක/ නීතිකාරක/ නීති සම්පාදක පැනවීමක් හෝ නියාමන දැනුම්දීම් (ගැසට්) ප්‍රකාශයට පත් කර නොමැත. අදාළ අමාත්‍යාංශය / රජයේ ආයතනය විසින් මෙය ලිඛිතව සනාථ කර ඇත.

- **අර්ධ වශයෙන් ක්‍රියාත්මක කර ඇත-** යෝජනාවේ සියලුම කොටස් සඳහා නොව සමහර කොටස් සඳහා අවශ්‍ය ව්‍යවස්ථාදායක/ නීතිකාරක/ නීති සම්පාදක පැනවීමක් හෝ නියාමන දැනුම්දීම් (ගැසට්) ප්‍රකාශයට පත් කර ඇත.

- **සම්පූර්ණව ක්‍රියාත්මක කර ඇත-** ප්‍රතිපත්ති යෝජනාව සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක කර ඇත. යෝජනාවේ සම්පූර්ණ විෂය පථය සඳහා අවශ්‍ය ව්‍යවස්ථාදායක/ නීතිකාරක/ නීති සම්පාදක පැනවීමක් හෝ නියාමන නිවේදනය (ගැසට් පත්‍රය) ප්‍රකාශයට පත් කර ඇති අතර වැඩිදුර ක්‍රියාමාර්ග අවශ්‍ය නොවේ.

## 3. ප්‍රගතිය, විවෘතභාවය සහ ශ්‍රේණිගත කිරීමේ තක්සේරු පිළිබඳ විස්තර.

| යෝජනාව | විවෘතභාවය | ප්‍රගතිය | නියෝජිත ශ්‍රේණිගත කිරීම |
|---|---|---|---|
| අරුවක්කාලුහි කැලිකසළ ප්‍රතිචක්‍රීකරණ සහ කළමනාකරණ ප්‍රදේශයක් සංවර්ධනය කිරීම | උදාසීන | මන්දගාමී ප්‍රගතියක් ඇත | මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය |
| | මෙම පොරොන්දුව සඳහා තොරතුරු: (1) ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව මගින් අන්තර්ජාලය ඔස්සේ සපයා ඇති "2018 මාර්තු 31 දිනට සංවර්ධන ව්‍යාපෘතීන්ගේ ප්‍රගතිය" යන වාර්තාව; සහ (2) තොරතුරු දැනගැනීමේ පනත යටතේ අදාළ ආයතනයෙන් ලබා ගත් ක්‍රියාකාරී සැලැස්ම, ප්‍රගති වාර්තාව හා මුල්‍ය වාර්තාව මගින් ලබා ගැනිණි. තොරතුරු ලබා ගැනීමේ පනත යටතේ තොරතුරු ලබා ගැනීමට නම් කළ නිලධාරියාට අභියාචනයක් ඉදිරිපත් කිරීමට සිදු වූ අතර, ක්‍රියාකාරී සැලැස්ම හා ප්‍රගති වාර්තාව එකිනෙකට වෙනස් ආකෘතීන් අනුව සකසා තිබූ හෙයින් තොරතුරු ඇගයීමට සැළකියයුතු පරිශ්‍රමයක් යෙදීමට සිදු විය. | මෙම පොරොන්දුව යටතේ වූ යම් යම් ක්‍රියාකාරකම් දැනටමත් ආරම්භ කර ඇති නමුත් 2018 වසරේ ප්‍රථම මාස හය තුළ ඉලක්කයන්ට සාපේක්ෂව ප්‍රගතිය පසුගාමීය. | |
| කෘෂි කර්මාන්තය, බිංදු ජල සම්පාදනය ඇතුලත් කෘෂි සැකසුම් කර්මාන්ත, කුකුළු පාලනය, ටින් කිරීම, වැවිලි කර්මාන්ත සහ | උදාසීන | මන්දගාමී ප්‍රගතියක් ඇත | මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය |

| යෝජනාව | විවෘතභාවය | ප්‍රගතිය | නියෝජිත ශ්‍රේණිගත කිරීම |
|---|---|---|---|
| හෝටල් කර්මාන්තයේ යෙදෙන සමාගම්හට තම විදුලිබල අවශ්‍යතාවය සපුරා ගැනීමට සූර්ය බලයෙන් විදුලි බලය නිෂ්පාදනය කිරීම සඳහා සහනදායී ණය යෝජනා ක්‍රමයක් | මෙම පොරොන්දුව සඳහා තොරතුරු: (1) ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව මගින් අන්තර්ජාලය ඔස්සේ සපයා ඇති "2018 මාර්තු 31 දිනට සංවර්ධන ව්‍යාපෘතීන්ගේ ප්‍රගතිය" යන වාර්තාව; සහ (2) තොරතුරු දැනගැනීමේ පනත යටතේ අදාළ ආයතනයෙන් ලබා ගත් ක්‍රියාකාරී සැලැස්ම, ප්‍රගති වාර්තාව හා මූල්‍ය වාර්තාව මගින් ලබා ගැනිණි. තොරතුරු ලබා ගැනීමේ පනත යටතේ තොරතුරු ලබා ගැනීමට නම් කළ නිලධාරියාට අභියාචනයක් ඉදිරිපත් කිරීමට සිදු විය. | මෙම පොරොන්දුව යටතේ වූ යම් යම් ක්‍රියාකාරකම් දැනටමත් ආරම්භ කර ඇති නමුත් මෙහි ප්‍රගතියට අදාළ තොරතුරු පවතින්නේ වසරේ පළමු මාස තුන (ජනවාරි සිට මාර්තු 2018) වෙනුවෙන් පමණි. මෙම පළමු මාස තුන වෙනුවෙන් පිහිටුවා ඇති ඉලක්කයන් අත්පත් කරගැනීමෙහිලා අදාළ පාර්ශව අපොහොසත් වී ඇත. ලද තොරතුරු අනුව 2018 මාර්තු 31 වන විට මෙම අයවැය පොරොන්දුවට අදාළව කිසිදු ප්‍රගතියක් (0%) ලබා නොමැති අතර මෙයට අදාළව කාලානුරූපී ඉලක්කද දක්වා නොමැත. | |
| භූගත ජල සම්පත අධීක්ෂණයට සහය දීම | සාධනීය | මන්දගාමී ප්‍රගතියක් ඇත | වාරිමාර්ග සහ ජල සම්පත් හා ආපදා කළමනාකරණ අමාත්‍යාංශය |
| | මෙම පොරොන්දුව සඳහා තොරතුරු: (1) ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව මගින් අන්තර්ජාලය ඔස්සේ සපයා ඇති "2018 මාර්තු 31 දිනට සංවර්ධන ව්‍යාපෘතීන්ගේ ප්‍රගතිය" යන වාර්තාව; සහ (2) තොරතුරු දැනගැනීමේ පනත යටතේ අදාළ ආයතනයෙන් ලබා ගත් ක්‍රියාකාරී සැලැස්ම, ප්‍රගති වාර්තාව හා මූල්‍ය වාර්තාව මගින් ලබා ගැනිණි. | මෙම පොරොන්දුව යටතේ වූ යම් යම් ක්‍රියාකාරකම් දැනටමත් ආරම්භ කර ඇති නමුත් මෙහි 2018 වසරේ ප්‍රථම මාස හය තුළ ඉලක්කයන්ට සාපේක්ෂව ප්‍රගතිය පසුගාමීය. | |
| සෑම ප්‍රාදේශීය සභා කොට්ඨාශයකම රාජ්‍ය - පෞද්ගලික හවුල්කාරිත්වයක් ලෙස හරිත උයනක් ඉදිකිරීම | ආවෘත | හෙළිකර නැත | මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය |
| | මෙම පොරොන්දුව පිලිබඳ කිසිදු තොරතුරක් ලබා ගැනීමට නොහැකි විය. | අයවැය පොරොන්දුව පිළිබඳව කිසිදු තොරතුරක් මූලාශ්‍රගතව නොපැවතීම හේතුවෙන් එහි ප්‍රගතිය තීරණය කළ නොහැක. | |

| යෝජනාව | විවෘතභාවය | ප්‍රගතිය | නියෝජිත ශ්‍රේණිගත කිරීම |
|---|---|---|---|
| නිල්වලා එළිය ආදර්ශ උද්‍යානය | සීමිත | මන්දගාමී ප්‍රගතියක් ඇත | මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය |
| | මෙම පොරොන්දුව සඳහා තොරතුරු ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව මගින්අන්තර්ජාලය ඔස්සේ සපයා ඇති "2018 මාර්තු 31 දිනට සංවර්ධන ව්‍යාපෘතීන්ගේ ප්‍රගතිය" යන වාර්තාව මගින් ලබා ගැනිණි. කෙසේ වෙතත් මුළු කාල පරිච්ඡේදය සඳහා ප්‍රගතිය ඇගයීමට මෙම තොරතුරු ප්‍රමාණවත් නොවිය. | පොරොන්දුව යටතේ වූ යම් යම් ක්‍රියාකාරකම් දැනටමත් ආරම්භ කර ඇති නමුත් මෙහි ප්‍රගතියට අදාළ තොරතුරු පවතින්නේ වසරේ පළමු මාස තුන (ජනවාරි සිට මාර්තු 2018) වෙනුවෙන් පමණි. මෙම පළමු මාස තුන වෙනුවෙන් පිහිටුවා ඇති ඉලක්කයන් අත්පත් කරගැනීමෙහිලා අදාළ පාර්ශව අපොහොසත් වී ඇත. ලද තොරතුරු අනුව 2018 මාර්තු 31 වන විට මෙම අයවැය පොරොන්දුවට අදාළව 40% ක ප්‍රගතියක් අත්පත් කරගැනීමට ඉලක්කගත කර ඇති අතර ඔවුන්ට 15% ක ප්‍රගතියක් අත් කරගැනීමට හැකිවී ඇත. | |
| කලපු 10 ක් පවිත්‍ර කිරීම | සාධනීය | මන්දගාමී ප්‍රගතියක් ඇත | ධීවර හා ජලජ සම්පත් සංවර්ධන සහ ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යාංශය |
| | මෙම පොරොන්දුව සඳහා තොරතුරු: (1) ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව මගින් අන්තර්ජාලය ඔස්සේ සපයා ඇති "2018 මාර්තු 31 දිනට සංවර්ධන ව්‍යාපෘතීන්ගේ ප්‍රගතිය" යන වාර්තාව; සහ (2) තොරතුරු දැනගැනීමේ පනත යටතේ අදාළ ආයතනයෙන් ලබා ගත් ක්‍රියාකාරී සැලැස්ම, ප්‍රගති වාර්තාව හා මූල්‍ය වාර්තාව මගින් ලබා ගැනිණි. | පොරොන්දුව යටතේ වූ යම් යම් ක්‍රියාකාරකම් දැනටමත් ආරම්භ කර ඇති නමුත් මෙහි 2018 වසරේ ප්‍රථම මාස හය තුළ ඉලක්ක අත්කර ගැනීමෙහිලා පෙන්නුම් කරනුයේ මන්දගාමී ප්‍රගතියකි. ලද තොරතුරු අනුව 2018 ජුනි 30 වන විට මෙම අයවැය පොරොන්දුවට අදාළව 61% ක ප්‍රගතියක් අත්පත් කරගැනීමට ඉලක්කගත කර ඇති අතර ඔවුන්ට 22% ක ප්‍රගතියක් අත් කරගැනීමට හැකිවී ඇත. | |
| කුඩා සහ මධ්‍ය පරිමාණ වැව්වල රොන්මඩ ඉවත් කිරීම | සීමිත | මන්දගාමී ප්‍රගතියක් ඇත | කෘෂිකර්ම අමාත්‍යාංශය |
| | මෙම පොරොන්දුව සඳහා තොරතුරු ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව මගින් අන්තර්ජාලය ඔස්සේ සපයා ඇති "2018 මාර්තු 31 දිනට සංවර්ධන ව්‍යාපෘතීන්ගේ | පොරොන්දුව යටතේ වූ යම් යම් යම් ක්‍රියාකාරකම් දැනටමත් ආරම්භ කර ඇති නමුත් මෙහි ප්‍රගතියට අදාළ තොරතුරු පවතින්නේ වසරේ පළමු මාස තුන (ජනවාරි | |

| යෝජනාව | විවෘතභාවය | ප්‍රගතිය | නියෝජිත ශ්‍රේණිගත කිරීම |
|---|---|---|---|
| | ප්‍රගතිය" යන වාර්තාව මගින් ලබා ගැනිණි. කෙසේ වෙතත් මුළු කාල පරිච්ඡේදය සඳහා ප්‍රගතිය ඇගයීමට මෙම තොරතුරු ප්‍රමාණවත් නොවීය. | සිට මාර්තු 2018) වෙනුවෙන් පමණි. මෙම පළමු මාස තුන වෙනුවෙන් පිහිටුවා ඇති ඉලක්කයන් අත්පත් කරගැනීමෙහිලා අදාළ පාර්ශව අපොහොසත් වී ඇත. ලද තොරතුරු අනුව 2018 මාර්තු 31 වන විට මෙම අයවැය පොරොන්දුවට අදාළව 10% ක ප්‍රගතියක් අත්පත් කරගැනීමට ඉලක්කගත කර ඇති අතර ඔවුන්ට 8% ක ප්‍රගතියක් අත් කරගැනීමට හැකිවී ඇත. සම්පූර්ණ ඇගයීම් කාලය (ජනවාරි-ජූනි 2018) වෙනුවෙන් ප්‍රගතිය ඇගයීමට නොහැකි බැවින් මන්දගාමී ප්‍රගතියක් ඇති බැව් උපකල්පනය කරයි. | |
| ගොවීන් සඳහා දායකත්ව රක්ෂණ යෝජනා ක්‍රමයක් හඳුන්වාදීම | උදාසීන | මන්දගාමී ප්‍රගතියක් ඇත | කෘෂිකර්ම අමාත්‍යාංශය |
| | මෙම පොරොන්දුව සඳහා තොරතුරු: (1) ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව මගින් අන්තර්ජාලය ඔස්සේ සපයා ඇති "2018 මාර්තු 31 දිනට සංවර්ධන ව්‍යාපෘතීන්ගේ ප්‍රගතිය" යන වාර්තාව; (2) කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද "2018 මාර්තු මස අග වන තෙක් මූල්‍ය ප්‍රගති වාර්තාව" සහ (3) තොරතුරු දැනගැනීමේ පනත යටතේ අදාළ ආයතනයෙන් ලබා ගත් ක්‍රියාකාරී සැලැස්ම, ප්‍රගති වාර්තාව හා මූල්‍ය වාර්තාව මගින් ලබා ගැනිණි. කෙසේ වෙතත් තොරතුරු දැනගැනීමේ පනත යටතේ තොරතුරු දැනගැනීමේ නිලධාරියාට ඉදිරිපත් කළ ලිපියට ප්‍රමාණවත් තොරතුරු නොලැබුණු අතර නම් කළ නිලධාරියාට අභියාචනයක් යොමු කිරීම මගින් ප්‍රගතිය ඇගයීමට අවශ්‍ය තොරතුරු ලබා ගැනිණි. | පොරොන්දුව යටතේ වූ යම් යම් යම් ක්‍රියාකාරකම් දැනටමත් ආරම්භ කර ඇති නමුත් මෙහි ප්‍රගතියට අදාළ තොරතුරු පවතින්නේ වසරේ පළමු මාස තුන (ජනවාරි සිට මාර්තු 2018) වෙනුවෙන් පමණි. මෙම පළමු මාස තුන වෙනුවෙන් පිහිටුවා ඇති ඉලක්කයන් අත්පත් කරගැනීමෙහිලා අදාළ පාර්ශව අපොහොසත් වී ඇත. ලද තොරතුරු අනුව 2018 මාර්තු 31 වන විට මෙම අයවැය පොරොන්දුවට අදාළව 10% ක ප්‍රගතියක් අත්පත් කරගැනීමට ඉලක්කගත කර ඇති අතර ඔවුන්ට 5% ක ප්‍රගතියක් අත් කරගැනීමට හැකිවී ඇත. සම්පූර්ණ ඇගයීම් කාලය (ජනවාරි-ජූනි 2018) වෙනුවෙන් ප්‍රගතිය ඇගයීමට නොහැකි බැවින් මන්දගාමී ප්‍රගතියක් ඇති බැව් උපකල්පනය කරයි | |
| ධීවර වරායවල්වල නැංගුරම්ලන ස්ථාන සංවර්ධනය සහ වැඩිදියුණු කිරීම | සාධනීය | සතුටුදායක ප්‍රගතියක් ඇත | ධීවර හා ජලජ සම්පත් සංවර්ධන සහ ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යාංශය |

| යෝජනාව | විවෘතභාවය | ප්‍රගතිය | නියෝජිත ශ්‍රේණිගත කිරීම |
|---|---|---|---|
| | මෙම පොරොන්දුව සඳහා තොරතුරු: (1)ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව මගින් අන්තර්ජාලය ඔස්සේ සපයා ඇති "2018 මාර්තු 31 දිනට සංවර්ධන ව්‍යාපෘතීන්ගේ ප්‍රගතිය" යන වාර්තාව; සහ (3) තොරතුරු දැනගැනීමේ පනත යටතේ අදාළ ආයතනයෙන් ලබා ගත් ක්‍රියාකාරී සැලැස්ම, ප්‍රගති වාර්තාව හා මුල්‍ය වාර්තාව මගින් ලබා ගැනිණි. | පොරොන්දුව යටතේ වූ ක්‍රියාකාරකම් දැනටමත් ආරම්භ කර ඇති 2018 වසරේ ප්‍රථම මාස හය තුළ ඉලක්ක අත්කර ගැනීමෙහිලා සතුටුදායක ප්‍රගතියක් අත්කරගෙන ඇත. ලද තොරතුරු අනුව 2018 ජුනි 30 වන විට මෙම අයවැය පොරොන්දුවට අදාළව 41% ක ප්‍රගතියක් (ප්‍රතිපාදනයන් මත බරතබන ලද අගය) අත්පත් කරගැනීමට ඉලක්කගත කර ඇති අතර ඔවුන්ට 34% ක ප්‍රගතියක් (ප්‍රතිපාදනයන් මත බරතබන ලද අගය) අත් කරගැනීමට හැකිවී ඇත. සම්පූර්ණ ඇගයීම් කාලය (ජනවාරි-ජූනි 2018) වෙනුවෙන් ප්‍රගතිය ඇගයීමට නොහැකි බැවින් මන්දගාමී ප්‍රගතියක් ඇති බැව් උපකල්පනය කරයි | |
| සංවර්ධන බැංකුවක් ස්ථාපිත කිරීම | උදාසීන | නොසලකා හැර ඇත | ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය |
| | තොරතුරු ලබා ගැනීමේ පනත යටතේ අදාළ ආයතනයෙහි නම් කළ නිලධාරියාට අභියාචනයක් ඉදිරිපත් කිරීම මගින් ප්‍රගතිය ඇගයීමට අවශ්‍ය තොරතුරු ලබා ගැනිණි. | ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම හේතුවෙන් මෙම අයවැය පොරොන්දුවට අදාළ ක්‍රියකාරකම් ආරම්භ කර නොමැත | |
| ග්‍රාම ශක්ති සහ දිළිඳු බව තුරන් කිරීමේ වැඩසටහන | උදාසීන | මන්දගාමී ප්‍රගතියක් ඇත | ජනාධිපති ලේකම් කාර්යාලය |
| | පොරොන්දුව ඇගයීම සඳහා තොරතුරු, තොරතුරු දැනගැනීමේ පනත යටතේ අදාළ ආයතනයෙන් ලබා ගත් ක්‍රියාකාරී සැලැස්ම, ප්‍රගති වාර්තාව හා මුල්‍ය වාර්තාව මගින් ලබා ගැනිණි. මෙම ලේඛන ලබා ගැනීමට සැලකිය යුතු පරිශ්‍රමයක් යෙදීමට සිදු වූ අතර ක්‍රියාකාරී සැලැස්ම හා ප්‍රගති වාර්තාව එකිනෙකට වෙනස් ආකෘතීන් අනුව සකසා තිබූ හෙයින් ප්‍රගතිය ඇගයීම අපහසු විය. | පොරොන්දුව යටතේ වූ යම් යම් ක්‍රියාකාරකම් දැනටමත් ආරම්භ කර ඇති නමුත් මෙහි 2018 වසරේ ප්‍රථම මාස හය තුළ ඉලක්ක අත්කර ගැනීමෙහිලා පෙන්නුම් කරනුයේ මන්දගාමී ප්‍රගතියකි. ලද තොරතුරු අනුව 2018 ජුනි 30 වන විට පිහිටුවා ඇත්තේ ග්‍රාම ශක්ති සමිති 78ක් පමණි. කෙසේ වෙතත් 2018 වර්ෂය තුළදී එවැනි සමිති 1000ක් පිහිටුවීමට ඉලක්ක කර ඇත | |

| යෝජනාව | විවෘතභාවය | ප්‍රගතිය | නියෝජිත ශ්‍රේණිගත කිරීම |
|---|---|---|---|
| මිල්ලනිය රෝජන කර්මාන්ත උද්‍යානය සඳහා යටිතල පහසුකම් ලබාදීම | උදාසීන | මන්දගාමී ප්‍රගතියක් ඇත | සංවර්ධන උපායමාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය |
| | පොරොන්දුව ඇගයීම සඳහා තොරතුරු, තොරතුරු දැනගැනීමේ පනත යටතේ අදාළ ආයතනයෙන් ලබා ගත් ක්‍රියාකාරී සැලැස්ම, ප්‍රගති වාර්තාව හා මූල්‍ය වාර්තාව මගින් ලබා ගැනිණි. මෙම ලේඛන ලබා ගැනීමට සැලකිය යුතු පරිශ්‍රමයක් යෙදීමට සිදු වූ අතර ක්‍රියාකාරී සැලැස්ම හා ප්‍රගති වාර්තාව එකිනෙකට වෙනස් ආකෘතීන් අනුව සකසා තිබූ හෙයින් ප්‍රගතිය ඇගයීම අපහසු විය. | පොරොන්දුව යටතේ වූ යම් යම් ක්‍රියාකාරකම් දැනටමත් ආරම්භ කර ඇති නමුත් මෙහි 2018 වසරේ ප්‍රථම මාස හය තුළ ඉලක්කයන්ට සාපේක්ෂව ප්‍රගතිය පසුගාමීය | |
| "රැකියා සඳහා සූදානම් කිරීමේ අරමුදල" ඇති කිරීම | උදාසීන | නොසලකා හැර ඇත | තරුණ කටයුතු, ව්‍යාපෘති කළමනාකරණ සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශය |
| | තොරතුරු දැනගැනීමේ පනත යටතේ අදාළ ආයතනයෙහි තොරතුරු දැනගැනීමේ නිලධාරියාට ඉදිරිපත් කළ ලිපියක් මගින් ප්‍රගතිය ඇගයීමට අවශ්‍ය දත්ත ලබා ගන්න ලදි. කෙසේ වෙතත් මෙයට මහත් පරිශ්‍රමයක් දැරීමට සිදු විය. | මෙම අයවැය යෝජනාව ක්‍රියාත්මක කිරීමට අදාළව කිසිදු ක්‍රියාකාරකමක් මෙතෙක් සිදුවී නැත. | |
| යොවුන් සේනාංක හරහා කුසලතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට සහාය දීම | සාධනීය | සතුටුදායක ප්‍රගතියක් ඇත | යොවුන් සේනාංකය |
| | පොරොන්දුව ඇගයීම සඳහා තොරතුරු, තොරතුරු දැනගැනීමේ පනත යටතේ අදාළ ආයතනයෙන් ලබා ගත් ක්‍රියාකාරී සැලැස්ම, ප්‍රගති වාර්තාව හා මූල්‍ය වාර්තාව මගින් ලබා ගැනිණි. | පොරොන්දුව යටතේ වූ ක්‍රියාකාරකම් දැනටමත් ආරම්භ කර ඇති 2018 වසරේ ප්‍රථම මාස හය තුළ ඉලක්ක අත්කර ගැනීමෙහිලා සතුටුදායක ප්‍රගතියක් අත්කරගෙන ඇත. ලද තොරතුරු අනුව 2018 ජුනි 30 වන විට මෙම අයවැය පොරොන්දුවට අදාළව 60% ක ප්‍රගතියක් අත්පත් කරගැනීමට ඉලක්කගත කර ඇති අතර ඔවුන්ට 75% ක ප්‍රගතියක් අත් කරගැනීමට හැකිවී ඇත. | |

| යෝජනාව | විවෘතභාවය | ප්‍රගතිය | නියෝජිත ශ්‍රේණිගත කිරීම |
|---|---|---|---|
| ස්විට්සර්ලන්ත සහ ජර්මානු රජයන්ගේ අනුග්‍රහය ඇතිව ජර්මන් කාර්මික අභ්‍යාස ආයතනය හා සම්බන්ධ කාර්මික විද්‍යාල 5 ක් ඇති කිරීම | සීමිත | හෙළිකර නැත | තරුණ කටයුතු, ව්‍යාපෘති කළමනාකරණ සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශය |
| | පොරොන්දුව ඇගයීම සඳහා තොරතුරු, තොරතුරු දැනගැනීමේ පනත යටතේ අදාළ ආයතනයෙන් ලබා ගත් ක්‍රියාකාරී සැලැස්ම, ප්‍රගති වාර්තාව හා මුල්‍ය වාර්තාව මගින් ලබා ගැනිණි. කෙසේ වෙතත් ආයතනය විසින් පොරොන්දුවට අදාලව සපුරාගැනීමට අදහස් කරන ඉලක්ක සපයා නොතිබූ හෙයින් ප්‍රගතිය ඇගයිය නොහැකි විය. | අයවැය යෝජනාව අත්කරගෙන ඇති ප්‍රගතිය නිර්ණය කිරීමට පවත්නා තොරතුරු ප්‍රමාණවත් නැත. | |
| අධ්‍යාපන ප්‍රතිසංස්කරණ | සීමිත | හෙළිකර නැත | අධ්‍යාපන අමාත්‍යාංශය |
| | මෙම පොරොන්දුව සඳහා තොරතුරු ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද "2018 මාර්තු 31 දිනට සංවර්ධන ව්‍යාපෘතීන්ගේ ප්‍රගතිය" යන වාර්තාව මගින් ලබා ගැනිණි. කෙසේ වෙතත් ක්‍රියාකාරී සැලැස්ම හා ප්‍රගති වාර්තාව එකිනෙකට වෙනස් ආකෘතීන් අනුව සකසා තිබූ හෙයින් ප්‍රගතිය ඇගයිය නොහැකි විය. | අයවැය යෝජනාව අත්කරගෙන ඇති ප්‍රගතිය නිර්ණය කිරීමට පවත්නා තොරතුරු ප්‍රමාණවත් නැත. | |
| ගුරුවරුන් සඳහා අඛණ්ඩ වෘත්තීය සංවර්ධන වැඩසටහන් | සීමිත | හෙළිකර නැත | අධ්‍යාපන අමාත්‍යාංශය |
| | තොරතුරු දැනගැනීමේ පනත යටතේ අදාළ ආයතනයෙහි තොරතුරු දැනගැනීමේ නිලධාරියාට ඉදිරිපත් කළ ලිපියක් මගින් ක්‍රියාකාරී සැලැස්ම, ප්‍රගති වාර්තාව හා මූල්‍ය වාර්තාව ලබා ගන්නා ලදි. කෙසේ වෙතත් කෙසේ වෙතත් පොරොන්දුවෙහි ප්‍රගතිය ඇගයීමට මෙම තොරතුරු ප්‍රමාණවත් නොවීය. | අයවැය පොරොන්දුව පිළිබඳව කිසිදු තොරතුරක් මූලාශ්‍රගතව නොපැවතීම හේතුවෙන් එහි ප්‍රගතිය තීරණය කළ නොහැක. | |

| යෝජනාව | විවෘතභාවය | ප්‍රගතිය | නියෝජිත ශ්‍රේණිගත කිරීම |
|---|---|---|---|
| වයඹ, සබරගමුව සහ මොරටුව විශ්ව විද්‍යාල සඳහා වෛද්‍ය පීඨ ඇති කිරීම | උදාසීන | හෙළිකර නැත | උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය |
| | මෙම පොරොන්දුව සඳහා තොරතුරු: (1) ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව මගින් අන්තර්ජාලය ඔස්සේ සපයා ඇති "2018 මාර්තු 31 දිනට සංවර්ධන ව්‍යාපෘතීන්ගේ ප්‍රගතිය" යන වාර්තාව; සහ (2) තොරතුරු දැනගැනීමේ පනත යටතේ අදාළ ආයතනයෙන් ලබා ගත් ක්‍රියාකාරී සැලැස්ම, ප්‍රගති වාර්තාව හා මූල්‍ය වාර්තාව මගින් ලබා ගැනිණි. එක් එක් විශ්ව විද්‍යාලවල තොරතුරු එකිනෙකට වෙනස් ආකෘතීන් අනුව සකසා තිබූ හෙයින් තොරතුරු දැනගැනීමේ පනත යටතේ ලබා ගත තොරතුරු ඇගයීමට මහත් පරිශ්‍රමයක් දැරීමට සිදු විය. | අයවැය යෝජනාව අත්කරගෙන ඇති ප්‍රගතිය නිර්ණය කිරීමට පවත්නා තොරතුරු ප්‍රමාණවත් නැත. | |
| තාක්ෂණික විෂය ධාරාව ව්‍යාප්ත කිරීම සඳහා නව තාක්ෂණික පීඨ 7 ක් ඇති කිරීම | උදාසීන | හෙළිකර නැත | උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය |
| | මෙම පොරොන්දුව සඳහා තොරතුරු, තොරතුරු දැනගැනීමේ පනත යටතේ අදාළ ආයතනයෙන් ලබා ගත් ක්‍රියාකාරී සැලැස්ම, ප්‍රගති වාර්තාව හා මූල්‍ය වාර්තාව මගින් ලබා ගැනිණි. එක් එක් විශ්ව විද්‍යාලවල තොරතුරු එකිනෙකට වෙනස් ආකෘතීන් අනුව සකසා තිබූ හෙයින් තොරතුරු දැනගැනීමේ පනත යටතේ ලබා ගත තොරතුරු ඇගයීමට මහත් පරිශ්‍රමයක් දැරීමට සිදු විය. | අයවැය යෝජනාව අත්කරගෙන ඇති ප්‍රගතිය නිර්ණය කිරීමට පවත්නා තොරතුරු ප්‍රමාණවත් නැත. | |
| දියගම ප්‍රදේශයේ ක්‍රීඩා පාසලක් සහ ඇකඩමියක් ස්ථාපිත | සීමිත | මන්දගාමී ප්‍රගතියක් ඇත | පළාත් සභා, පළාත් පාලන සහ ක්‍රීඩා අමාත්‍යාංශය |

| යෝජනාව | විවෘතභාවය | ප්‍රගතිය | නියෝජිත ශ්‍රේණිගත කිරීම |
|---|---|---|---|
| කිරීම සහ 2020 දකුණු ආසියානු ක්‍රීඩා උළෙල සඳහා ක්‍රීඩා සංකීර්ණයක් පිළියෙළ කිරීම | මෙම පොරොන්දුව සඳහා තොරතුරු ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව මගින් අන්තර්ජාලය ඔස්සේ සපයා ඇති "2018 මාර්තු 31 දිනට සංවර්ධන ව්‍යාපෘතීන්ගේ ප්‍රගතිය" යන වාර්තාව මගින් ලබා ගැනිණි. කෙසේ වෙතත් මුළු කාල පරිච්ඡේදය සඳහා ප්‍රගතිය ඇගයීමට මෙම තොරතුරු ප්‍රමාණවත් නොවීය. | පොරොන්දුව යටතේ වූ යම් යම් යම් ක්‍රියාකාරකම් දැනටමත් ආරම්භ කර ඇති නමුත් මෙහි ප්‍රගතියට අදාළ තොරතුරු පවතින්නේ වසරේ පළමු මාස තුන (ජනවාරි සිට මාර්තු 2018) වෙනුවෙන් පමණි. මෙම පළමු මාස තුන වෙනුවෙන් පිහිටුවා ඇති ඉලක්කයන් අත්පත් කරගැනීමෙහිලා අදාළ පාර්ශව අපොහොසත් වී ඇත. ලද තොරතුරු අනුව 2018 මාර්තු 31 වන විට මෙම අයවැය පොරොන්දුවට අදාළව 10% ක ප්‍රගතියක් අත්පත් කරගැනීමට ඉලක්කගත කර ඇති අතර ඔවුන්ට 10% ක ප්‍රගතියක් අත් කරගැනීමට හැකිවී ඇත. සම්පූර්ණ ඇගයීම් කාලය (ජනවාරි-ජූනි 2018) වෙනුවෙන් ප්‍රගතිය ඇගයීමට නොහැකි බැවින් මන්දගාමී ප්‍රගතියක් ඇති බැව් උපකල්පනය කරයි | |
| සුගතදාස එළිමහන් ක්‍රීඩාංගනය නඟා සිටුවීම | උදාසීන | මන්දගාමී ප්‍රගතියක් ඇත | පළාත් සභා, පළාත් පාලන සහ ක්‍රීඩා අමාත්‍යාංශය |
| | මෙම පොරොන්දුව සඳහා තොරතුරු: (1) ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව මගින් අන්තර්ජාලය ඔස්සේ සපයා ඇති "2018 මාර්තු 31 දිනට සංවර්ධන ව්‍යාපෘතීන්ගේ ප්‍රගතිය" යන වාර්තාව; සහ (2) තොරතුරු දැනගැනීමේ පනත යටතේ අදාළ ආයතනයෙන් ලබා ගත් ක්‍රියාකාරී සැලැස්ම, ප්‍රගති වාර්තාව හා මූල්‍ය වාර්තාව මගින් ලබා ගැනිණි. තොරතුරු ලබා ගැනීමේ පනත යටතේ තොරතුරු ලබා ගැනීමට නම් කළ නිලධාරියාට අභියාචනයක් ඉදිරිපත් කිරීමට සිදු විය. | පොරොන්දුව යටතේ වූ යම් යම් ක්‍රියාකාරකම් දැනටමත් ආරම්භ කර ඇති නමුත් මෙහි 2018 වසරේ ප්‍රථම මාස හය තුළ ඉලක්ක අත්කර ගැනීමෙහිලා පෙන්නුම් කරනුයේ මන්දගාමී ප්‍රගතියකි. ලද තොරතුරු අනුව 2018 ජූනි 30 වන විට මෙම අයවැය පොරොන්දුවට අදාළව 64% ක ප්‍රගතියක් (ප්‍රතිපාදනයන් මත බරතබන ලද අගය) අත්පත් කරගැනීමට ඉලක්කගත කර ඇති අතර ඔවුන්ට 23% ක ප්‍රගතියක් (ප්‍රතිපාදනයන් මත බරතබන ලද අගය) අත් කරගැනීමට හැකිවී ඇත | |
| 2020 වනවිට අඩු ආදායම්ලාභීන් සඳහා | සාධනීය | සතුටුදායක ප්‍රගතියක් ඇත | මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය |

| යෝජනාව | විවෘතභාවය | ප්‍රගතිය | නියෝජිත ශ්‍රේණිගත කිරීම |
|---|---|---|---|
| නාගරික පුනරුත්ථාපන ව්‍යාපෘතිය යටතේ නිවාස 20,000 ක් ලබාදීම | මෙම පොරොන්දුව සඳහා තොරතුරු: (1) ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව මගින් අන්තර්ජාලය ඔස්සේ සපයා ඇති "2018 මාර්තු 31 දිනට සංවර්ධන ව්‍යාපෘතීන්ගේ ප්‍රගතිය" යන වාර්තාව; සහ (2) තොරතුරු දැනගැනීමේ පනත යටතේ අදාළ ආයතනයෙන් ලබා ගත් ක්‍රියාකාරී සැලැස්ම, ප්‍රගති වාර්තාව හා මූල්‍ය වාර්තාව මගින් ලබා ගැනිණි. | පොරොන්දුව යටතේ වූ ක්‍රියාකාරකම් දැනටමත් ආරම්භ කර ඇති 2018 වසරේ ප්‍රථම මාස හය තුළ ඉලක්ක අත්කර ගැනීමෙහිලා සතුටුදායක ප්‍රගතියක් අත්කරගෙන ඇත. ලද තොරතුරු අනුව 2018 ජුනි 30 වන විට මෙම අයවැය පොරොන්දුවට අදාළව 69% ක (ප්‍රතිපාදනයන් මත බරතබන ලද අගය) ප්‍රගතියක් අත්පත් කරගැනීමට ඉලක්කගත කර ඇති අතර ඔවුන්ට 63% ක (ප්‍රතිපාදනයන් මත බරතබන ලද අගය) ප්‍රගතියක් අත් කරගැනීමට හැකිවී ඇත. | |
| උතුරු නැගෙනහිර පළාත්වල නිවාස ඉදිකිරීම | සාධනීය | මන්දගාමී ප්‍රගතියක් ඇත | නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය |
| | මෙම පොරොන්දුව සඳහා තොරතුරු: (1) ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව මගින් අන්තර්ජාලය ඔස්සේ සපයා ඇති "2018 මාර්තු 31 දිනට සංවර්ධන ව්‍යාපෘතීන්ගේ ප්‍රගතිය" යන වාර්තාව; සහ (2) තොරතුරු දැනගැනීමේ පනත යටතේ අදාළ ආයතනයෙන් ලබා ගත් ක්‍රියාකාරී සැලැස්ම, ප්‍රගති වාර්තාව හා මූල්‍ය වාර්තාව මගින් ලබා ගැනිණි. | පොරොන්දුව යටතේ වූ යම් යම් ක්‍රියාකාරකම් දැනටමත් ආරම්භ කර ඇති නමුත් මෙහි 2018 වසරේ ප්‍රථම මාස හය තුළ ඉලක්ක අත්කර ගැනීමෙහිලා පෙන්නුම් කරනුයේ මන්දගාමී ප්‍රගතියකි. ලද තොරතුරු අනුව 2018 ජුනි 30 වන විට මෙම අයවැය පොරොන්දුවට අදාළව 64% ක ප්‍රගතියක් අත්පත් කරගැනීමට ඉලක්කගත කර ඇති අතර ඔවුන්ට 54% ක ප්‍රගතියක් අත් කරගැනීමට හැකිවී ඇත. | |
| වැවිලි ක්ෂේත්‍රය ආශ්‍රිතව නිවාස ඉදිකිරීම | සාධනීය | මන්දගාමී ප්‍රගතියක් ඇත | කඳුරට නව ගම්මාන, යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය |
| | මෙම පොරොන්දුව සඳහා තොරතුරු: (1) ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව මගින් අන්තර්ජාලය ඔස්සේ සපයා ඇති "2018 මාර්තු 31 දිනට සංවර්ධන ව්‍යාපෘතීන්ගේ ප්‍රගතිය" යන වාර්තාව; සහ (2) තොරතුරු දැනගැනීමේ පනත යටතේ අදාළ ආයතනයෙන් | පොරොන්දුව යටතේ වූ යම් යම් ක්‍රියාකාරකම් දැනටමත් ආරම්භ කර ඇති නමුත් මෙහි 2018 වසරේ ප්‍රථම මාස හය තුළ ඉලක්ක අත්කර ගැනීමෙහිලා පෙන්නුම් කරනුයේ මන්දගාමී ප්‍රගතියකි. ලද තොරතුරු අනුව | |

| යෝජනාව | විවෘතභාවය | ප්‍රගතිය | නියෝජිත ශ්‍රේණිගත කිරීම |
|---|---|---|---|
| | ලබා ගත් ක්‍රියාකාරී සැලැස්ම, ප්‍රගති වාර්තාව හා මුල්‍ය වාර්තාව මගින් ලබා ගැනිණි. | 2018 ජුනි 30 වන විට නව ව්‍යාපෘති වල ප්‍රගතිය 20% කට වඩා අඩු අගයක් වාර්තා කර ඇත. | |
| නිවාස හිමියන්ගේ නිවාස යෝජනා ක්‍රමය සහ ග්‍රාමීය අංශයේ දැනට පවතින නිවාස වැඩිදියුණු කිරීම සඳහා සහාය දීම | සාධනීය | මන්දගාමී ප්‍රගතියක් ඇත | නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය |
| | තොරතුරු දැනගැනීමේ පනත යටතේ අදාළ ආයතනයෙන් ලබා ගත් ක්‍රියාකාරී සැලැස්ම, ප්‍රගති වාර්තාව හා මුල්‍ය වාර්තාව මගින් මෙම පොරොන්දුවට අදාළ තොරතුරු ලබා ගැනිණි. | පොරොන්දුව යටතේ වූ යම් යම් ක්‍රියාකාරකම් දැනටමත් ආරම්භ කර ඇති නමුත් මෙහි 2018 වසරේ ප්‍රථම මාස හය තුළ ඉලක්ක අත්කර ගැනීමෙහිලා පෙන්නුම් කරනුයේ මන්දගාමී ප්‍රගතියකි. ලද තොරතුරු අනුව 2018 ජුනි 30 වන විට මෙම අයවැය පොරොන්දුවට අදාළ ඉලක්කගත ප්‍රගතියෙන් 37% ක ප්‍රගතියක් අත්පත් කරගැනීමට හැකිවී ඇත. | |
| නාගරික පුනර්ජනනීය ව්‍යාපෘතිය | ආවෘත | හෙළිකර නැත | මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය |
| | මෙම පොරොන්දුව පිලිබඳ කිසිදු තොරතුරක් ලබා ගැනීමට නොහැකි විය. | අයවැය පොරොන්දුව පිළිබඳව කිසිදු තොරතුරක් මුලාශ්‍රගතව නොපැවතීම හේතුවෙන් එහි ප්‍රගතිය තීරණය කළ නොහැක. | |
| නගර සංවර්ධනය සහ මහනුවර, අනුරාධපුරය, ගාල්ල, යාපනය යන දිස්ත්‍රික්කයන්හි උපාය මාර්ගික නගර සංවර්ධන වැඩසටහන | උදාසීන | මන්දගාමී ප්‍රගතියක් ඇත | මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය |
| | මෙම පොරොන්දුව සඳහා තොරතුරු: (1) ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව මගින් අන්තර්ජාලය ඔස්සේ සපයා ඇති "2018 මාර්තු 31 දිනට සංවර්ධන ව්‍යාපෘතීන්ගේ ප්‍රගතිය" යන වාර්තාව; සහ (2) තොරතුරු දැනගැනීමේ පනත යටතේ අදාළ ආයතනයෙන් ලබා ගත් ක්‍රියාකාරී සැලැස්ම, ප්‍රගති වාර්තාව හා මුල්‍ය වාර්තාව මගින් ලබා ගැනිණි. තොරතුරු ලබා ගැනීමේ පනත යටතේ | පොරොන්දුව යටතේ වූ යම් යම් ක්‍රියාකාරකම් දැනටමත් ආරම්භ කර ඇති නමුත් මෙහි 2018 වසරේ ප්‍රථම මාස හය තුළ ඉලක්ක අත්කර ගැනීමෙහිලා පෙන්නුම් කරනුයේ මන්දගාමී ප්‍රගතියකි. ලද තොරතුරු අනුව 2018 ජුනි 30 වන විට මෙම අයවැය පොරොන්දුවට අදාළව 15.9% ක (ප්‍රතිපාදනයන් මත බරතබන ලද අගය) ප්‍රගතියක් අත්පත් කරගැනීමට ඉලක්කගත කර ඇති අතර ඔවුන්ට 7.3% ක (ප්‍රතිපාදනයන් මත | |

| යෝජනාව | විවෘතභාවය | ප්‍රගතිය | නියෝජිත ශ්‍රේණිගත කිරීම |
|---|---|---|---|
| | තොරතුරු ලබා ගැනීමට නම් කළ නිලධාරියාට අභියාචනයක් ඉදිරිපත් කිරීමට සිදු විය. | බරතබන ලද අගය) ප්‍රගතියක් අත් කරගැනීමට හැකිවී ඇත. | |
| කල්මුණේ සහ සමන්තුරෙයි නගර සංවර්ධනය සඳහා වන ප්‍රධාන සැලසුම ක්‍රියාත්මක කිරීම සහ පසුගාමී කලාප වල නගර සංවර්ධනය කිරීම | සීමිත | මන්දගාමී ප්‍රගතියක් ඇත | නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශය |
| | මෙම පොරොන්දුව සඳහා තොරතුරු: (1) ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද "2018 මාර්තු 31 දිනට සංවර්ධන ව්‍යාපෘතීන්ගේ ප්‍රගතිය" යන වාර්තාව; සහ (2) තොරතුරු දැනගැනීමේ පනත යටතේ අදාළ ආයතනයෙන් ලබා ගත් ක්‍රියාකාරී සැලැස්ම, ප්‍රගති වාර්තාව හා මූල්‍ය වාර්තාව මගින් ලබා ගැනිණි. කෙසේ වෙතත් මුළු කාල පරිච්ඡේදය සඳහා ප්‍රගතිය ඇගයීමට මෙම තොරතුරු ප්‍රමාණවත් නොවීය. | පොරොන්දුව යටතේ වූ යම් යම් ක්‍රියාකාරකම් දැනටමත් ආරම්භ කර ඇති නමුත් මෙහි ප්‍රගතියට අදාළ තොරතුරු පවතින්නේ වසරේ පළමු මාස තුන (ජනවාරි සිට මාර්තු 2018) වෙනුවෙන් පමණි. මෙම මාස තුන තුළදී ඉලක්කයන්ට සාපේක්ෂව ප්‍රගතිය පසුගාමීය. | |
| මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය | විවෘත | මන්දගාමී ප්‍රගතියක් ඇත | මහාමාර්ග හා මාර්ග සංවර්ධන අමාත්‍යාංශය |
| | මෙම පොරොන්දුවට අදාළ සැලකිය යුතු තොරතුරු ප්‍රමාණයක් ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව මගින් අන්තර්ජාලය ඔස්සේ සපයා ඇති "2018 මැයි 31 දිනට ප්‍රමුඛතා ව්‍යාපෘතිවල ප්‍රගතිය" යන වාර්තාව මගින් ලබා ගැනිණි. | පොරොන්දුව යටතේ වූ යම් යම් ක්‍රියාකාරකම් දැනටමත් ආරම්භ කර ඇති නමුත් මෙහි ප්‍රගතියට අදාළ තොරතුරු පවතින්නේ වසරේ පළමු මාස පහ වෙනුවෙන් පමණි. මෙම මාස පහ තුළදී ඉලක්කයන්ට සාපේක්ෂව ප්‍රගතිය පසුගාමීය. | |
| ග්‍රාමීය මාර්ග ජාලය වැඩිදියුණු කිරීම | සීමිත | හෙළිකර නැත | මහාමාර්ග හා මාර්ග සංවර්ධන අමාත්‍යාංශය |
| | මෙම පොරොන්දුව සඳහා සමහර තොරතුරු ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව මගින් අන්තර්ජාලය ඔස්සේ සපයා ඇති "2018 මාර්තු 31 දිනට සංවර්ධන ව්‍යාපෘතීන්ගේ ප්‍රගතිය" යන වාර්තාව මගින් ලබා ගැනිණි. කෙසේ වෙතත් පොරොන්දුව සඳහා වෙන් කළ මුළු | අයවැය යෝජනාව අත්කරගෙන ඇති ප්‍රගතිය නිර්ණය කිරීමට පවත්නා තොරතුරු ප්‍රමාණවත් නැත. | |

| යෝජනාව | විවෘතභාවය | ප්‍රගතිය | නියෝජිත ශ්‍රේණිගත කිරීම |
|---|---|---|---|
| | ප්‍රතිපාදන පිලිබඳ තොරතුරු මෙම වාර්තාවෙහි ඇතුළත්ව නොතිබූ හෙයින් ප්‍රගතිය ඇගයීමට නොහැකි විය. | | |
| ගංවතුර හා නායයෑම් හේතුවෙන් අපදාවට පත් වූ මාර්ග පුනරුත්ථාපනය කිරීම | උදාසීන | හෙළිකර නැත | වාරිමාර්ග සහ ජල සම්පත් හා ආපදා කළමනාකරණ අමාත්‍යාංශය |
| | මෙම පොරොන්දුව සඳහා තොරතුරු: (1) ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව මගින් අන්තර්ජාලය ඔස්සේ සපයා ඇති "2018 මාර්තු 31 දිනට සංවර්ධන ව්‍යාපෘතීන්ගේ ප්‍රගතිය" යන වාර්තාව; සහ (2) තොරතුරු දැනගැනීමේ පනත යටතේ අදාළ ආයතනයෙන් ලබා ගත් ක්‍රියාකාරී සැලැස්ම, ප්‍රගති වාර්තාව හා මූල්‍ය වාර්තාව මගින් ලබා ගැනිණි. කෙසේ වෙතත් පොරොන්දුව සඳහා වෙන් කළ මුළු ප්‍රතිපාදන පිලිබඳ තොරතුරු මෙම වාර්තාවෙහි ඇතුළත්ව නොතිබූ හෙයින් ප්‍රගතිය ඇගයීමට නොහැකි විය. | අයවැය යෝජනාව අත්කරගෙන ඇති ප්‍රගතිය නිර්ණය කිරීමට පවත්නා තොරතුරු ප්‍රමාණවත් නැත. | |
| ලංකා බැංකුව සඳහා ප්‍රාග්ධන පහසුකම් සැපයීම | ආවෘත | හෙළිකර නැත | මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය |
| | මෙම පොරොන්දුව පිලිබඳ කිසිදු තොරතුරක් ලබා ගැනීමට නොහැකි විය. | අයවැය පොරොන්දුව පිළිබඳව කිසිදු තොරතුරක් මූලාශ්‍රගතව නොපැවතීම හේතුවෙන් එහි ප්‍රගතිය තීරණය කළ නොහැක. | |
| තාක්ෂණය හා ඩිජිටල්කරණය තුළින් තොරතුරු සන්නිවේදන තාක්ෂණ ආයතනයේ සේවා සැපයීම වැඩිදියුණු කිරීම | උදාසීන | මන්දගාමී ප්‍රගතියක් ඇත | විදුලි සංදේශ, ඩිජිටල් යටිතල පහසුකම් හා විදේශ රැකියා අමාත්‍යාංශය |
| | මෙම පොරොන්දුව සඳහා තොරතුරු: (1) ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව මගින් අන්තර්ජාලය ඔස්සේ සපයා ඇති "2018 මාර්තු 31 දිනට සංවර්ධන ව්‍යාපෘතීන්ගේ ප්‍රගතිය" යන වාර්තාව; සහ (2) | පොරොන්දුව යටතේ වූ යම් යම් ක්‍රියාකාරකම් දැනටමත් ආරම්භ කර ඇති නමුත් මෙහි 2018 වසරේ ප්‍රථම මාස හය තුළ ඉලක්ක අත්කර ගැනීමෙහිලා පෙන්නුම් කරනුයේ මන්දගාමී ප්‍රගතියකි. ලද තොරතුරු අනුව | |

| යෝජනාව | විවෘතභාවය | ප්‍රගතිය | නියෝජිත ශ්‍රේණිගත කිරීම |
|---|---|---|---|
| | තොරතුරු දැනගැනීමේ පනත යටතේ අදාළ ආයතනයෙන් ලබා ගත් ප්‍රගති වාර්තාව මගින් ලබා ගැනිණි. එහෙත් මෙම වාර්තා මගින් ලබා ගත් තොරතුරු අසම්පූර්ණ ව තිබූ හෙයින් පොරොන්දුවෙහි මුළු ප්‍රගතිය ඇගයිය නොහැකි විය. | 2018 අගෝස්තු 31 වන විට මෙම අයවැය පොරොන්දුවට අදාළව 65% ක (ප්‍රතිපාදනයන් මත බරතබන ලද අගය) ප්‍රගතියක් අත්පත් කරගැනීමට ඉලක්කගත කර ඇති අතර ඔවුන්ට 63% ක (ප්‍රතිපාදනයන් මත බරතබන ලද අගය) ප්‍රගතියක් අත් කරගැනීමට හැකිවී ඇත. | |
| සංහිඳියාව ශක්තිමත් කරමින් ආර්ථිකය සවිබල ගැන්වීම හා සමාජ යටිතල පහසුකම් සංවර්ධනය පිළිබඳ අවධානය යොමු කිරීම සහ උතුරු හා නැගෙනහිර පළාත්වල වෙනස් හැකියාවන් සහිත කාන්තාවන්ගේ අවශ්‍යතා සපුරාලීමට විශේෂ වැඩසටහන් | සාධනීය | අතහැර දමා ඇත | ජාතික ඒකාබද්ධතා, සංහිඳියා සහ රාජ්‍ය භාෂා අමාත්‍යාංශය |
| | තොරතුරු දැනගැනීමේ පනත යටතේ අදාළ ආයතනයට ඉල්ලුම්පතක් යොමු කිරීම මගින් අවශ්‍ය තොරතුරු ලබා ගන්නා ලදි. | මෙම අයවැය යෝජනාව පිළිබඳව අයවැය කතාවේදී අනියුක්ත කරන ලද රාජ්‍ය ආයතනය තවදුරටත් කටයුතු නොකරයි. | |
| ණය සමුපකාර සමිති හරහා උතුරු හා උතුරුමැද පළාත්වල ණයගැති ජනයාට සහය ලබාදීම | සීමිත | මන්දගාමී ප්‍රගතියක් ඇත | නැවත පදිංචි කිරීම, පුනරුත්ථාපන, උතුරු සංවර්ධන සහ හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශය |
| | මෙම පොරොන්දුව සඳහා තොරතුරු: (1) ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව මගින් අන්තර්ජාලය ඔස්සේ සපයා ඇති "2018 මාර්තු 31 දිනට සංවර්ධන ව්‍යාපෘතීන්ගේ ප්‍රගතිය" යන වාර්තාව මගින් හා (2) තොරතුරු දැනගැනීමේ පනත යටතේ අදාළ ආයතනයෙන් | පොරොන්දුව යටතේ වූ යම් යම් ක්‍රියාකාරකම් දැනටමත් ආරම්භ කර ඇති නමුත් මෙහි ප්‍රගතියට අදාළ තොරතුරු පවතින්නේ වසරේ පළමු මාස තුන (ජනවාරි සිට මාර්තු 2018) වෙනුවෙන් පමණි. මෙම පළමු මාස තුන වෙනුවෙන් පිහිටුවා ඇති ඉලක්කයන් අත්පත් කරගැනීමෙහිලා අදාළ පාර්ශව අපොහොසත් වී ඇත. | |

| යෝජනාව | විවෘතභාවය | ප්‍රගතිය | නියෝජිත ශ්‍රේණිගත කිරීම |
|---|---|---|---|
| | ලබා ගත් ක්‍රියාකාරී සැලැස්ම, ප්‍රගති වාර්තාව හා මූල්‍ය වාර්තාව මගින් ලබා ගැනිණි. තොරතුරු ලබා ගැනීමේ පනත යටතේ තොරතුරු ලබා ගැනීමට නම් කළ නිලධාරියාට අභියාචනයක් ඉදිරිපත් කිරීමට සිදු විය. ක්‍රියාකාරී සැලැස්ම හා ප්‍රගති වාර්තාව එකිනෙකට වෙනස් ආකෘතීන් දෙකකට අනුව සකසා තිබූ හෙයින් ප්‍රගතිය ඇගයීමට මහත් පරිශ්‍රමයක් දැරිය යුතු විය. | ලද තොරතුරු අනුව 2018 මාර්තු 31 වන විට මෙම අයවැය පොරොන්දුවට අදාළව 20% ක ප්‍රගතියක් අත්පත් කරගැනීමට ඉලක්කගත කර ඇති අතර ඔවුන්ට 5% ක ප්‍රගතියක් අත් කරගැනීමට හැකිවී ඇත. සම්පූර්ණ ඇගයීම් කාලය (ජනවාරි-ජූනි 2018) වෙනුවෙන් ප්‍රගතිය ඇගයීමට නොහැකි බැවින් මන්දගාමී ප්‍රගතියක් ඇති බැව් උපකල්පනය කරයි | |
| නිෂ්පාදන සමූපකාර හරහා උතුරු පළාතේ තෝරාගත් කුඩා කර්මාන්ත සඳහා පහසුකම් සැපයීම | උදාසීන | මන්දගාමී ප්‍රගතියක් ඇත | නැවත පදිංචි කිරීම, පුනරුත්ථාපන, උතුරු සංවර්ධන සහ හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශය |
| | මෙම පොරොන්දුව සඳහා තොරතුරු: (1) ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව මගින් අන්තර්ජාලය ඔස්සේ සපයා ඇති "2018 මාර්තු 31 දිනට සංවර්ධන ව්‍යාපෘතීන්ගේ ප්‍රගතිය" යන වාර්තාව; සහ (2) තොරතුරු දැනගැනීමේ පනත යටතේ අදාළ ආයතනයෙන් ලබා ගත් ක්‍රියාකාරී සැලැස්ම, ප්‍රගති වාර්තාව හා මූල්‍ය වාර්තාව මගින් ලබා ගැනිණි. තොරතුරු ලබා ගැනීමේ පනත යටතේ තොරතුරු ලබා ගැනීමට නම් කළ නිලධාරියාට අභියාචනයක් ඉදිරිපත් කිරීමට සිදු විය. ක්‍රියාකාරී සැලැස්ම හා ප්‍රගති වාර්තාව එකිනෙකට වෙනස් ආකෘතීන් දෙකකට අනුව සකසා තිබූ හෙයින් ප්‍රගතිය ඇගයීමට මහත් පරිශ්‍රමයක් දැරිය යුතු විය. | පොරොන්දුව යටතේ වූ යම් යම් ක්‍රියාකාරකම් දැනටමත් ආරම්භ කර ඇති නමුත් මෙහි 2018 වසරේ ප්‍රථම මාස හය තුළ ඉලක්කයන්ට සාපේක්ෂව ප්‍රගතිය පසුගාමීය. | |
| මුස්ලිම් අවතැන් වූවන් නැවත පදිංචි කිරීම - නිවාස සහ යටිතල පහසුකම් සැපයීම | උදාසීන | මන්දගාමී ප්‍රගතියක් ඇත | කර්මාන්ත හා වාණිජ අමාත්‍යාංශය |
| | තොරතුරු දැනගැනීමේ පනත යටතේ අදාළ ආයතනයෙන් ලබා ගත් ක්‍රියාකාරී සැලැස්ම, ප්‍රගති වාර්තාව හා මූල්‍ය වාර්තාවමගින් ප්‍රගතිය ඇගයීමට අවශ්‍ය දත්ත ලබා ගන්න ලදි. | පොරොන්දුව යටතේ වූ යම් යම් ක්‍රියාකාරකම් දැනටමත් ආරම්භ කර ඇති නමුත් මෙහි 2018 වසරේ ප්‍රථම මාස හය තුළ ඉලක්කයන්ට සාපේක්ෂව ප්‍රගතිය පසුගාමීය. | |

| යෝජනාව | විවෘතභාවය | ප්‍රගතිය | නියෝජිත ශ්‍රේණිගත කිරීම |
|---|---|---|---|
| | කෙසේ වෙතත් මෙයට මහත් පරිශ්‍රමයක් දැරීමට සිදු වූ අතර, නම් කළ නිලධාරියාට අභියාචනයක්ද ඉදිරිපත් කෙරිණි. | | |
| අතුරුදහන්වූ පුද්ගලයින් සඳහා කාර්යාලයක් පිහිටුවීම සඳහා සහයවීම | සීමිත | මන්දගාමී ප්‍රගතියක් ඇත | ජාතික ඒකාබද්ධතා, සංහිඳියා සහ රාජ්‍ය භාෂා අමාත්‍යාංශය |
| | මෙම පොරොන්දුව සඳහා සමහර තොරතුරු ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව මගින් අන්තර්ජාලය ඔස්සේ සපයා ඇති "2018 මාර්තු 31 දිනට සංවර්ධන ව්‍යාපෘතීන්ගේ ප්‍රගතිය" යන වාර්තාව මගින් ලබා ගැනිණි. කෙසේ වෙතත් මුළු කාල සීමාව සඳහා ප්‍රගතිය ඇගයීමට මෙම තොරතුරු ප්‍රමාණවත් නොවීය. | පොරොන්දුව යටතේ වූ යම් යම් යම් ක්‍රියාකාරකම් දැනටමත් ආරම්භ කර ඇති නමුත් මෙහි ප්‍රගතියට අදාළ තොරතුරු පවතින්නේ වසරේ පළමු මාස තුන (ජනවාරි සිට මාර්තු 2018) වෙනුවෙන් පමණි. මෙම පළමු මාස තුන වෙනුවෙන් පිහිටුවා ඇති ඉලක්කයන් අත්පත් කරගැනීමෙහිලා අදාළ පාර්ශව අපොහොසත් වී ඇත. ලද තොරතුරු අනුව 2018 මාර්තු 31 වන විට මෙම අයවැය පොරොන්දුවට අදාළව 40% ක ප්‍රගතියක් අත්පත් කරගැනීමට ඉලක්කගත කර ඇති අතර ඔවුන්ට 30% ක ප්‍රගතියක් අත් කරගැනීමට හැකිවී ඇත. සම්පූර්ණ ඇගයීම් කාලය (ජනවාරි-ජූනි 2018) වෙනුවෙන් ප්‍රගතිය ඇගයීමට නොහැකි බැවින් මන්දගාමී ප්‍රගතියක් ඇති බැව් උපකල්පනය කරයි. | |
| සංහිඳියාව ශක්තිමත් කරමින් ආර්ථිකය සවිබල ගැන්වීම හා සමාජ යටිතල පහසුකම් සංවර්ධනය පිළිබඳ අවධානය යොමු කිරීම සහ උතුරු හා නැගෙනහිර පළාත්වල වෙනස් හැකියාවන් සහිත කාන්තාවන්ගේ | උදාසීන | මන්දගාමී ප්‍රගතියක් ඇත | නැවත පදිංචි කිරීම, පුනරුත්ථාපන, උතුරු සංවර්ධන සහ හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශය |
| | පොරොන්දුව ඇගයීම සඳහා තොරතුරු: (1) ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව මගින් අන්තර්ජාලය ඔස්සේ සපයා ඇති "2018 මාර්තු 31 දිනට සංවර්ධන ව්‍යාපෘතීන්ගේ ප්‍රගතිය" යන වාර්තාව මගින් හා (2) තොරතුරු දැනගැනීමේ පනත යටතේ අදාළ ආයතනයෙන් | පොරොන්දුව යටතේ වූ යම් යම් ක්‍රියාකාරකම් දැනටමත් ආරම්භ කර ඇති නමුත් මෙහි 2018 වසරේ ප්‍රථම මාස හය තුළ ඉලක්කයන්ට සාපේක්ෂව ප්‍රගතිය පසුගාමීය. | |

| යෝජනාව | විවෘතභාවය | ප්‍රගතිය | නියෝජිත ශ්‍රේණිගත කිරීම |
|---|---|---|---|
| අවශ්‍යතා සපුරාලීමට විශේෂ වැඩසටහන් | ලබා ගත් ප්‍රගති වාර්තාව මගින් ලබා ගැනිණි. ක්‍රියාකාරී සැලැස්ම හා ප්‍රගති වාර්තාව එකිනෙකට වෙනස් ආකෘතීන් දෙකකට අනුව සකසා තිබූ හෙයින් ප්‍රගතිය ඇගයීමට සැළකිය යුතු පරිශ්‍රමයක් යෙදීමට සිදු විය. | | |

**වගකීම්හරණය**

**මෙම වෙබ් අඩවියෙහි අන්තර්ගත වන තොරතුරු ලබා ගනු ලබන්නේ රජයේ වාර්තා, නිල ප්‍රකාශන, ප්‍රසිද්ධ වාර්තා, සහ තොරතුරු දැනගැනීමේ පණත යටතේ ලබාගත් තොරතුරු යනාදිය වෙතිනි. තවද, මෙම වෙබ් අඩවියේ පළ කරනු ලබන තොරතුරු කිසිවක් කිසිදු ආකාරයකින් වෙරිටේ රිසර්ච් ආයතනයේ හෝ එහි සාමාජිකයන්ගේ පෞද්ගලික අදහස් යැයි අර්ථකථනය කළ නොහැක. එමෙන්ම මෙම වෙබ් අඩවියේ ඇති යම් තොරතුරක ප්‍රතිඵලයක් ලෙසින් කිසියම් කෙනෙකු අප්‍රසිද්ධියට හෝ අපකීර්තියට පත්වුවහොත් එයට වෙරිටේ රිසර්ච් මොනයම් ආකාරයකින් හෝ වග කියනු නොලැබේ.**

**අපගේ වෙබ් අඩවිය සඳහා හැකිතාක් විශ්වාසදායී තොරතුරු ලබා ගැනීමට උපරිම ලෙස ක්‍රියාකළද, මෙම රැස් කරගත් තොරතුරුවල තිබිය හැකි අක්‍රමිකතා හෝ අතපසුවීම් නිසා එම තොරතුරු භාවිතයෙන් උද්ගත විය හැකි ගැටලුවලට වෙරිටේ රිසර්ච් හෝ** BudgetPromises.org **වෙබ් අඩිවයේ ක්‍රියාකාරීන් වග කියනු නොලැබේ.**

**එමෙන්ම වෙරිටේ රිසර්ච් ආයතනයේ පූර්ව ලිඛිත අනුමැතියකින් තොරව අප විසින් ප්‍රකාශයට පත් කරනු ලබන තොරතුරු වෙනස් කිරීමට, අන් තැනෙක ප්‍රකාශ කිරීමට, සම්ප්‍රේෂණය කිරීමට, හුවමාරු කිරීමට, විකිණීමට, ප්‍රතිනිර්මාණය කිරීමට, බෙදා හැරීමට, නැවත පළ කිරීමට, අභිවහනය කිරීමට, ප්‍රදර්ශනය කිරීමට හෝ කිසිදු වාණිජමය අරමුණකින් අපයෝජනය කිරීමට කිසිවෙකුට කිසිසේත් හිමිකම් නැත. එමෙන්ම වෙරිටේ රිසර්ච් ආයතනයේ අනුමැතිය සහිතව හෝ රහිතව** BudgetPromises.org **හි තොරතුරු භාවිතා කිරීමෙන් ඇති විය හැකි ප්‍රතිවිපාකවලටද අපි වග නොකියමු.**

**වෙරිටේ රිසර්ච් ආයතනය කිසිදු දේශපාලන පක්ෂයක් සහ/හෝ දේශපාලන අරමුණු ඇති සංවිධානයකට සහය හෝ අනුමැතිය නොදක්වන අතර එවැනි කිසිවක් වෙනුවෙන් පෙනී සිටීම හෝ නියෝජනය කිරීම ද නොකරයි.**

**මෙම වෙබ් අඩවියේ සඳහන් වන තොරතුරු මහජනයා අතර දැනුවත්භාවය නංවාලනු වස් කිසිදු අයකිරීමකින් තොරව සපයනු ලැබේ. එමෙන්ම වෙරිටේ රිසර්ච් ආයතනය හෝ** BudgetPromises.org **කණ්ඩායම කිසිදු පාර්ශවයක් සමඟ මෙම වෙබ් අඩවියේ සඳහන් තොරතුරු ලබාදීමට කිසිදු ගිවිසුමකට හෝ අවබෝධතාවකට එළඹ නැත.**

**මෙම වෙබ් අඩවියට ඇතුලත් වන්නේ** budgetpromises.org **විසින් විශ්ලේෂණය කර සම්පාදනය කරන ලද ස්වාධීන විශ්ලේෂණයන්හි ප්‍රතිඵල වන අතර එමඟින් දත්ත වල පවතින ප්‍රවණතාවයන් සහ හැසිරීම ඉදිරිපත් කර ඇත. එම තොරතුරුවලින් කිසිවක්, කිසිවකු විසින් ප්‍රතිඋත්පාදනය කරන්නට අදහස් කරන්නේනම් වෙරිටේ රිසර්ච් ආයතනයේ පූර්ව අනුමැතිය ලබා ගත යුතුය.**